# මහජන චීන සමූහාණ්ඩුවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් අතර ඒකාබද්ධ ප්‍රකාශය

1. මහජන චීන සමූහාණ්ඩු රාජ්‍ය සභාවේ අග්‍රාමාත්‍ය අතිගරු ලී කචිඅන්ග් මැතිතුමාගේ ආරාධනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය, අතිගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2016 අප්‍රේල් 06 සිට 09 දක්වා කාලය තුළ මහජන චීන සමූහාණ්ඩුවේ නිල සංචාරයක නිරත විය.

2. මෙම සංචාරය අතරවාරයේදී අග්‍රාමාත්‍ය, රනිල් වික්‍රමසිංහ මැතිතුමා මහජන චීන සමූහාණ්ඩුවේ ජනාධිපති, අතිගරු ෂී ජින්පිං මැතිතුමා බැහැ දැකීය. මහජන චීන සමූහාණ්ඩුවේ රාජ්‍ය සභාවේ අග්‍රාමාත්‍ය අතිගරු ලී කචිඅන්ග් මැතිතුමන් සමඟ සාකච්ඡා පැවැත්වූ අග්‍රාමාත්‍ය වික්‍රමසිංහ මැතිතුමා ජාතික මහජන කොන්ග්‍රස් සභාවේ ස්ථාවර කමිටුවේ සභාපති අතිගරු ජන්ග් දජිඅන් මැතිතුමා හමුවිය. උණුසුම් හා මිත්‍රශීලී වාතාවරණයක් යටතේ ගැඹුරින් අදහස් හුවමාරු කරගත් නායකයින් දෙපළ චීන - ශ්‍රී ලංකා සබඳතා සම්බන්ධයෙන් මෙන්ම දෙරටම පොදුවේ උනන්දුවක් දක්වන ජාත්‍යන්තර හා කලාපීය ප්‍රශ්න සම්බන්ධයෙන්ද පුළුල් එකඟත්වයකට එළැඹිණ.

3. දෙපාර්ශවය අතර සුහද සම්බන්ධතා, චිරාත් කාලයක් තිස්සේ තිරසාර ලෙස පැවැත ආ බවටත් ඕනෑම වාතාවරණයක් යටතේ මිත්‍රත්වය නොසැලී පවත්වාගෙන යාම අරභයා දෙපාර්ශවය කටයුතු කරන බවටත් ඔවුහු අදහස් හුවමාරු කර ගත්හ. අවංක, අන්‍යෝන්‍ය සහයෝගීතාව හා සදාකාලික මිතුදම පදනම් කරගනිමින් චීනයත් ශ්‍රී ලංකාවත් අතර ගොඩනැගී ඇති උපායමාර්ගික සහයෝගිතාව තුළින් දෙරට ජනතාවගේ මූලික අභිලාෂයන් ඉටුකරන අතර

දෙරටෙහි සංවර්ධනයත් දෙරට ජනතාවගේ සුභසිද්ධියත් උදෙසා දායකත්වය ලබාදෙයි. අන්‍යෝන්‍ය වශයෙන් හිතකරවන්නා වූ සහයෝගීතාව පුළුල් කර ගැනීම උදෙසා මිත්‍රත්වය තහවුරු කර ගැනීමටත් විවිධ කලාපීය හා ජාත්‍යන්තර සංසදවලදී අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගය සලසාදීමටත් දෙපාර්ශවය ඇප කැපවී කටයුතු කරනු ඇත.

4. ස්වාධිපත්‍යය, භෞමික අඛණ්ඩතාව, ස්ථායිතාව හා තම රටවල සංවර්ධනය මූලික කොට සළකමින් දෙරටටම පොදුවේ බලපාන ප්‍රශ්නවලදී අන්‍යෝන්‍ය වශයෙන් සහය ලබා දීමට දෙපාර්ශවය යළි ප්‍රතිඥා දුන්හ. සාමකාමී සහජීවනයේ පස් වැදෑරුම් ප්‍රතිපත්තියට අනුව කටයුතු කරන බවත්, වෙනත් රටවල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීම සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර නීතියේ මූලික නියමයන් පිළිපදින බවත් දෙපාර්ශවය විසින් අවධාරණය කරන ලදී. ජාතික සමඟිය, සාමය හා සංහිඳියාව පවත්වා ගැනීම සහ ආර්ථික සංවර්ධනය ඇති කිරීමෙහිලා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්න සම්බන්ධයෙන් චීනයේ සහය පළවෙයි. චීනයේ "එක් චීන දේශයක්" යන ප්‍රතිපත්තිය කෙරෙහි ශ්‍රී ලංකාවේ ඇප කැපවීම හා ජාතික සමඟිය ආරක්ෂා කර ගැනීමෙහිලා චීන රජය දරන ප්‍රයත්න සඳහා සහය ලබා දෙන බවට ශ්‍රී ලංකාව විසින් යළි යළිත් තහවුරු කරන ලදී. දකුණු චීන මුහුදේ සාමය හා ස්ථායිතාව පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳව දෙපාර්ශවයම අවධාරණය කළහ. පැන නැගී ඇති ආරවුල් හා මතභේද, ජාත්‍යන්තර නීතිය හා එහි පරිචයන්ට අනුකූලව අදාළ පාර්ශව අතර ඵලදායි සංවාද හා උපදේශන පැවැත්වීම මෙන්ම සහයෝගිතාවයෙන් යුතුව කටයුතු කිරීම තුළින් සමථයකට පත් කර ගන්නා ලෙස ශ්‍රී ලංකා පාර්ශවය විසින් ඉල්ලා සිටිනු ලැබීය. එවැනි සංවාද උපදේශන මෙන්ම සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම මගින් කලාපය තුළ සාමය හා ආරක්ෂාව සුරක්ෂිත කිරීමට චීන රජය විසින් දරන ප්‍රයත්න මෙන්ම සූදානම ද ශ්‍රී ලංකාවේ පැසසුමට භාජනය විය.

5. චීන ජනාධිපති ෂී ජින්පිං මැතිතුමා 2014 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ නියැලුණ රාජ්‍ය සංචාරයත් ශ්‍රී ලංකාවේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2015 මාර්තු මාසයේදී චීනයේ නියැලුණ රාජ්‍ය සංචාරයත් ඓතිහාසික වැදගත්කමක් උසුලන විශේෂ සිදුවීම්වන බව ඔවුහු පැවසූහ. දෙරටේ නායකයින් එළඹී පොදු එකඟතා සාක්ෂාත් කරගැනීම සහ චීන-ශ්‍රී ලංකා සම්බන්ධතා වැඩි දියුණු කරමින් නව විශිෂ්ටතා මට්ටමකට එළඹීම සඳහා දෙරට සාමූහිකව ප්‍රයත්න දරනු ඇත.

6. ඉහළ මට්ටමින් සිදු කරන හුවමාරු වැඩි කිරීම තුළින් ද්වීපාර්ශවික සම්බන්ධතාද ද්වීපාර්ශවික සංචාර හා බහු පාර්ශවික සංසද රැස්වීම් තුළින් සියලු තරාතිරම්වල ක්‍රමවත් සම්බන්ධතාද, තවදුරටත් වර්ධනය කිරීමට දෙපාර්ශවයම එකඟ වූහ.

7. චීනය විසින් හඳුන්වා දෙන ලද සමුද්‍රික සේද මාවත හා ගොඩබිම් සේද මාවත පිළිබඳ මූලික කටයුතුවලදී තම ක්‍රියාකාරී සහභාගිත්වය ලබාදෙන බව අවධාරණය කළ ශ්‍රී ලංකාව, පුරාතනයේ පැවැති පරිදි ඉන්දියානු සාගර වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස නැවතත් ස්ථාපිත වීමේ අපේක්ෂාවෙන් පසුවෙයි. දෙපාර්ශවයටම අන්‍යොන්‍ය වශයෙන් වාසිදායකවන ආකාරයෙන් සංවර්ධන සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීමට දෙරටේම එකඟතාව පළවිණි. පුළුල් ආර්ථික සහයෝගීතාවක් වෙනුවෙන් 21 වන සියවසේ සමුද්‍රික සේද මාවත තැනීම සම්බන්ධයෙන් වූ චීනයේ අභිලාෂයට ශ්‍රී ලංකාවද දායක වූ අතර එමගින් මිත්‍රත්වය, ආර්ථික සහයෝගීතාව, සමාජ සංස්කෘතික හුවමාරුව මෙන්ම සබැඳියාව සඳහා මංපෙත් විවර වෙයි. යටිතල පහසුකම් සංවර්ධනය තවදුරටත් නඟා සිටුවීමටත්, චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා කිරීමටත්, බද්ධ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමටත්, ආර්ථික සංස්කෘතික, විද්‍යාත්මක හා තාක්ෂණික

සහයෝගීතාව පුළුල් කර ගැනීමටත්, ඇති වී ඇති සංවර්ධනය මගින් ජනතාවට ප්‍රතිලාභ හා වෙනත් දෑ ලැබෙන බව තහවුරු කිරීම සඳහා දෙරට ජනතාව අතර සම්බන්ධතා පුළුල් කිරීමත්, පොදු ඉරණමක් භුක්ති විඳින ප්‍රජාවක් බිහිකිරීමත් අරමුණුකර ගනිමින් දෙපාර්ශයවය විසින් 21වැනි සියවසේ සමුද්‍රික සේද මාවතක් සකස් කරගනු ඇත.

8. රටේ ආර්ථික සංවර්ධනයට මහෝපකාරී වන චීන ව්‍යවසායන් සමඟ ධනාත්මක සබඳතා ගොඩනඟා ගැනීමට ශ්‍රී ලංකාව අපේක්‍ෂා කරයි. තවද, චීන ව්‍යවසායන් වැඩි වැඩියෙන් ශ්‍රී ලංකාවේ ආයෝජනය කරනු ඇතැයිද චීන ව්‍යාපාර සඳහා යෝග්‍ය ආයෝජන වටපිටාවක් සහ ව්‍යාපාරික පරිසරයක් ඇතිකර දෙමින් චීන සමාගම් සමඟ, තම සහයෝගීතාව දිගින් දිගටම පවත්වා ගැනීමට හැකිවනු ඇතැයි ද ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි. අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක තත්ත්වයක් උදාකර ගැනීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා චීනයේ තරඟකාරී වෙළඳ සමාගම් චීනය විසින් අඛණ්ඩව දිරිගැන්වෙනු ඇත. එසේම, ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් හා සම්බන්ධ ඉදිකිරීම්වලට මූල්‍ය දායකත්වය ලබා දෙන ලෙස මූල්‍ය ආයතන දිරිමත් කිරීමද චීනය විසින් සිදුකරනු ලබයි.

9. ප්‍රවාහන, බලශක්ති සහ අනෙකුත් යටිතල පහසුකම්, කර්මාන්ත පුර සහ නිෂ්පාදන කර්මාන්තය ආදී ක්ෂේත්‍රවලදී පවත්නා සහයෝගීතාව වැඩිදියුණු කිරීමට දෙපාර්ශවය එකඟත්වය පළ කළහ. කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ වැඩ කටයුතු නැවත ආරම්භ කරන බව ප්‍රකාශ කර සිටි ශ්‍රී ලංකාව විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට හා සහාය ලබා දීමට කැමැත්ත ද පළ කරන ලදී. ශ්‍රී ලංකාවේ සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සහ චීනයේ වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය අතර 2016 අප්‍රේල් මස 07 වැනි දින අත්සන් තැබුණු ආයෝජන, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුමේ සඳහන් ප්‍රධාන පෙළේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම

උදෙසා චීන සමාගම් සමඟ සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කිරීමට ඇති කැමැත්ත ද මෙහිදී ප්‍රකාශ කරන ලදී.

10. ද්වීපාර්ශවික ආර්ථික සහ වෙළඳ සහයෝගීතාව සම්බන්ධයෙන් අත්කර ගත් ජයග්‍රහණ පිළිබඳව සතුට ප්‍රකාශ කරමින් චීන - ශ්‍රී ලංකා ඒකාබද්ධ වෙළඳ කමිටුවේ හත්වැනි සැසිවාරය මෙම වසරේ නුදුරු දිනයකදී පැවැත්වීමට දෙපාර්ශවය කථිකා කර ගත්හ. මීළඟ වසර 5 - 10 කාල සීමාවට අදාළ ද්වීපාර්ශවික ආර්ථික මෙන්ම වෙළඳ සහයෝගීතාව සම්බන්ධයෙන් වන සංවර්ධන සැලැස්ම අධ්‍යයනය කිරීම සහ සැකසීම මෙම ඒකාබද්ධ වෙළඳ කමිටුව මගින් සිදුකිරීමට නියමිතය. දෙපාර්ශවය අතර ද්වීපාර්ශවික වෙළඳ හා ආර්ථික සහයෝගීතාව ඉහළ නැංවීමේ අභිලාෂය පෙරදැරිව චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ සාකච්ඡාවන්හි තෙවන වටය හැකිතාක් ආසන්න දිනයක පැවැත්වීමටත්, එම සාකච්ජා පවත්වා අවසන් කිරීමටත් එකඟතාවයකට එළැඹිණි. භාණ්ඩ හා සේවා වෙළඳාම, ආයෝජන සහ ආර්ථික සහයෝගීතාව අන්තර්ගතවන සමවබෝධිත නිදහස් වෙළඳ ගිවිසුමක් පිළිබඳව සාකච්ජා පවත්වමින් චීනය හා ශ්‍රී ලංකාව අතර මීට පෙර පැවති නිදහස් වෙළඳ ගිවිසුමකට අනුව කටයුතු කිරීමටද දෙරටේ එකඟතාව පළවිය.

11. ශ්‍රී ලංකාවේ ආර්ථිකමය හා සමාජයීය සංවර්ධනය, ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම සහ විශේෂයෙන් මහජන සෞඛ්‍ය සේවා, කෘෂිකර්මාන්තය, හා ජල සංරක්ෂණය ආදී ක්ෂේත්‍රවල ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකාවට තම සහාය අඛණ්ඩව ලබාදීමට චීනය විසින් ප්‍රතිඥා දෙන ලදී. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ධීවර, දෙමුහුන් වී සහ තේ කර්මාන්තය ආශ්‍රිත පරිපාලන හා තාක්ෂණික සේවා පිරිස් සඳහා පුහුණු අවස්ථා මෙන්ම පර්යේෂණ කටයුතු සඳහා අවස්ථා සලසාදීමට ද චීනය කැමැත්ත ප්‍රකාශ කර සිටියි. ධීවර කර්මාන්තය, මිරිදිය ධීවර කර්මාන්තය හා ජල ජීවී වගාව ආශ්‍රිත සහයෝගීතාව පුළුල් කිරීම සඳහා අත්සන් තැබුණු ධීවර කර්මාන්තයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම පූර්ණ වශයෙන් ක්‍රියාවට නැංවීමට දෙපාර්ශවය සමීපව

කටයුතු කරනු ඇත. රටේ ආර්ථික සහයෝගීතාව සඳහා චීනය ලබාදෙන දායකත්වය ශ්‍රී ලංකාවේ පැසසුමට ලක්විය.

12. වෙරළ හා සමුද්‍රික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කමිටුවේ දෙවන සැසිවාරය මෙන්ම සමුද්‍රික හා වෙරළ සහයෝගීතාව පිළිබඳ පළමු වැඩමුළුව ආසන්න දිනයකදී පැවැත්වීමට දෙපාර්ශවය එකඟ වූහ. සාගර නිරීක්ෂණය, සමුද්‍රික කාලගුණවිද්‍යාව, පරිසර පද්ධති ආරක්ෂණය, සමුද්‍රික සම්පත් කළමනාකරණය, සමුද්‍රික පුරා විද්‍යාව, ගවේෂණ සහ මුදා ගැනීම්, මුහුදු කොල්ලකෑම් මර්දනය, යාත්‍රා කිරීමේදී ආරක්ෂාව සහ සමුද්‍රික කටයුතුවල නියැලෙන පිරිස් සඳහා පුහුණුව ලබාදීම ආදිය ප්‍රවර්ධනය කිරීම සඳහාද දෙපාර්ශවයේ එකඟතාවය පළවිය. දෙරටේ දූෂණ මැඩලීමේ හා අධීක්ෂණ කටයුතුවලට අදාළ දෙපාර්තමේන්තු අතර අදහස් හුවමාරු කර ගැනීමට දෙපාර්ශවය එකඟ වූ අතර මේ සම්බන්ධයෙන් අන්‍යොන්‍ය අවබෝධය සහ සහයෝගිතාව වර්ධනය කර ගත යුතු බව ද අවධාරණය කළහ.

13. ආරක්ෂක ක්ෂේත්‍රයේ සමීප සම්බන්ධතා පවත්වා ගැනීම පිළිබඳව ද දෙපාර්ශ්වයේ කැමැත්ත පළ විය. රාජ්‍ය ආරක්ෂාව හා ආරක්ෂාව සම්බන්ධයෙන් සාමූහිකව කටයුතු කිරීමේ අවශ්‍යතාවය දෙපාර්ශ්වය විසින් තවදුරටත් අවධාරණය කරනු ලැබීය.

14. තාක්ෂණ විද්‍යා සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගිතාවය ශක්තිමත් කිරීම සඳහා මෙම දෙපාර්ශවයම එකඟතාව පළ කළහ. චීනය, ශ්‍රී ලංකාවේ ශක්‍යතා සංවර්ධනය වැඩි දියුණු කිරීමට හැකිවන ආකාරයෙන් ඒකාබද්ධ කෘෂිකාර්මික තාක්ෂණ විද්‍යා ප්‍රදර්ශක උද්‍යානයක් හා ඒකාබද්ධ ජෛව විද්‍යා තාක්ෂණ විද්‍යාගාරයක් දෙරටේ සාමූහිකත්වයෙන් ස්ථාපනය කිරීමට ඇති ඉඩකඩ පිළිබඳව සොයා බැලීමට කෙටි කාලීන පැවරුම් මත ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයන්ට චීනයට යාමට ඉඩප්‍රස්ථාව උදා කරදෙනු ඇත. සුරක්ෂිත ජල සැපයුම් තාක්ෂණය පිළිබඳ ඒකාබද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය හැකි ඉක්මණින් ක්‍රියාත්මක කිරීමට ද දෙපාර්ශව එකඟ වූහ. නිදන්ගත වකුගඩු රෝගයට පාදක වන හේතු කාරක හඳුනාගනිමින් ඒ සම්බන්ධයෙන් සහාය ලබා දීමට ද චීනය කැමැත්තෙන් පසුවෙයි.

15. චීනය, ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණෙන රටවල් අතරින් දෙවන ස්ථානය හිමිකරගන්නා අතර චීනය සමඟ පවත්නා ද්විපාර්ශවික සහයෝගීතාවය සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන තිබීම පිළිබඳව දෙපාර්ශවය සතුට පළ කළහ. චීනයේ දී පැවැත්වෙන ලෝක සංචාරක කටයුතු පිළිබඳ ප්‍රථම රැස්වීමට සහභාගීවන ලෙස චීනය ශ්‍රී ලංකාවට ආරාධනා කළ අතර , චීන සංචාරක වෙළඳපොළේ කොටස් වැඩි කර ගැනීමට ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නවලදී ශ්‍රී ලංකාවට සහය ලබා දෙනු ඇත. තවද, සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව යොදා ගැනීමට චීන සංචාරකයන් අඛණ්ඩව දිරිමත් කරනු ඇත. දෙරට අතර නිරන්තර ඍජු ගුවන් ගමන් ආරම්භ කිරීමට දෙපාර්ශවය විසින්ම දෙරටේ ගුවන් සමාගම් දිරිමත් කරනු ලබයි.

16. චීන හා ශ්‍රී ලාංකික ජනතාව අතර පවත්නා ශක්තිමත් ඓතිහාසික සබඳතා සැලකිල්ලට ගනිමින්, දෙරටේ ජනතාව අතර සහසම්බන්ධතා වැඩිදියුණු කර ගැනීමට සහ සංස්කෘතික සහයෝගිතාව ශක්තිමත් කර ගැනීමට දෙපාර්ශවය එකඟ වූහ. මේ සම්බන්ධයෙන්, චීන - ශ්‍රී ලංකා සමුද්‍රීක සේද මාවත යන තේමාව යටතේ දෙරටේ සංස්කෘතික බලධාරීන්ගේ සම සත්කාරකත්වයෙන් ප්‍රදර්ශනයක් කොළඹ දී පැවැත්වීමට ඔවුහු කැමැත්ත පළ කළහ. දෙරටේ ජනතාව අතර අන්‍යෝන්‍ය අවබෝධය හා මිත්‍රත්වය තව දුරටත් වර්ධනය කිරීම සඳහා චීන සංස්කෘතික මධ්‍යස්ථානයේ හා කොන්ෆියුසියස් ආයතනයේ කාර්ය කටයුතු ප්‍රවර්ධනය කිරීමේදී දෙරටම ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටුකරනු ඇත. වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමඟ පවතින සහයෝගිතාව ශක්තිමත් කිරීම සඳහා මීලඟ වසර 5 තුළදී දැනට ශ්‍රී ලංකාවට ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව ප්‍රමාණය වැඩි කිරීමට හා පුහුණු අවස්ථා 2000ක් ලබා දීමට චීනය කැමැත්ත පළ කරයි. දෙරටේ විශ්ව විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන, විද්වත් මණ්ඩල හා මාධ්‍ය අතර සිදු කරනු ලබන හුවමාරු හා සහයෝගීතාව පුළුල් කිරීමට දෙපාර්ශවය විසින්ම කටයුතු කරනු ඇත. ශ්‍රී ලාංකික තරුණ තරුණියන් 100 දෙනෙකුට චීනයට පැමිණෙන ලෙස කළ ආරාධනයට ශ්‍රී ලංකාව විසින් චීනය වෙත සිය ස්තූතිය පළ කරනු ලැබීය.

17. එක්සත් ජාතීන්ගේ සංවිධානයේදී, ආසියාන් කලාපීය සංසදයේ දී හා වෙනත් කලාපීය හා බහුපාර්ශ්වීය සංසදවලදී සම්බන්ධීකරණය හා සහයෝගීතාවය තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා දෙපාර්ශවය එකඟතාවය පළ කළහ. එක්සත් ජාතීන්ගේ ප්‍රතිසංස්කරණ, මානව හිමිකම්, කාලගුණික විපර්යාස හා ත්‍රස්තවාදය මැඩ පැවැත්වීම යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් තව දුරටත්

සහයෝගිතාව වර්ධනය කිරීම පිළිබඳව දෙරටම සාකච්ඡා පැවැත්වූහ. සාර්ක් සංවිධානය සමඟ ප්‍රගතිශීලි හා ව්‍යාපෘති කේන්ද්‍ර කොටගත් වැඩ කටයුතුවල නියැලීමට චීනයේ කැමැත්ත පළ වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සිය සතුට පළ කරයි. ශ්‍රී ලංකාව ආරම්භක සාමාජිකයෙකු ලෙස ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවට එක් වීම පිළිබඳව චීනය සිය සතුට පළකරයි.

18. චීනය හා ශ්‍රී ලංකාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 60 වන සංවත්සරය 2017 වසරේ දී සැමරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කොට ඒ පිළිබඳව සාමූහිකව කටයුතු කිරීමට ඔවුහු මෙහි දී එකඟතාව පළ කළහ.

19. තමාට සහ තම නියෝජිත කණ්ඩායමට පිරිනමන ලද උණුසුම් ආගන්තුක සත්කාරය වෙනුවෙන් මහජන චීන රජයට සහ එහි ජනතාවට අග්‍රාමාත්‍ය වික්‍රමසිංහ මැතිතුමා සිය ප්‍රශංසාව පුද කළේය. අග්‍රාමාත්‍ය වික්‍රමසිංහ මැතිතුමා චීන අග්‍රාමාත්‍ය ලී කචිඅන්ග් මැතිතුමාට ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලෙන ලෙස ආරාධනා කර සිටියේය. අග්‍රාමාත්‍ය ලී කචිඅන්ග් මැතිතුමා මෙම ආරාධනය පිළිබඳව ස්තූතිය පුදකළ අතර අන්‍යෝන්‍ය වශයෙන් පහසු දිනයකදී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලීමට සිය කැමැත්ත පළ කළේය.

20. මෙම සංචාරයේ දී, වෙළඳ හා ආයෝජන, විද්‍යා හා තාක්ෂණ, සෞඛ්‍ය සහ අධිකරණ ක්ෂේත්‍ර ආවරණය කරමින් ගිවිසුම් රැසකට අත්සන් තැබිණි.

අප්‍රේල් 09 වැනි දින බීජිං හිදී නිකුත් කරන ලදී.